සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 6 – First Term Test – April 2019

**පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 6 ශ්‍රේණිය**

කාලය : පැය 2
**Time :2 hours**

## Mathematics – I
## ගණිතය – I

Name :- ..................................................... Grade : -................ Index number:-....................

❖ **ප්‍රශ්න සියල්ලටම මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

1. එකතු කරන්න.

   125 + 78 + 4

2. මෙම රූපයේ ඇති වෘත්ත ගණන කොපමණ ද?



3. 23401200 සංඛ්‍යාව සම්මත ආකාරයට ලියන්න.

4. අඩු කරන්න.

   246 – 89

5. පහත දී ඇති වේලාව සම්මත ආකාරයට ලියන්න.

   14 : 15

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

6. වෘත්ත ඇඳීමට භාවිත කළ හැකි ද්‍රව්‍ය දෙකක් ලියන්න.

(i) (ii)

7. 2019 මාර්තු පළමු වන දිනය අන්තර්ජාතික සම්මත ආකාරයට දක්වන්න.

8. වෘත්තය මත පිහිටීම් දක්වා ඇති අක්ෂර ලියන්න.




9. සෘජුකෝණ දෙකක විශාලත්වයේ එකතුවට සමාන වන කෝණය කුමක් ද?

10. පහත ප්‍රකාශන හරි නම් '✓' ලකුණ ද, වැරදි නම් 'x' ලකුණ ද යොදන්න.

(i) පංති කාමරයේ බිත්ති සහ දොර සිරස් වේ. ( )

(ii) එක් මිනිත්තුවක දී තත්පර කටුව වට 60 ක් ගමන් කරයි. ( )

11. පහත රූපයෙන් දැක්වෙන් මිරිස් පැළ තවානකි. A කොටසේ මිරිස් පැළ 70 ක් තිබේ නම් සම්පූර්ණ තවානේ ඇති මිරිස් පැළ සංඛ්‍යාව නිමානය කරන්න.




12. එකතු කරන්න.

| මිනිත්තු | තත්පර |
|---|---|
| 3 | 15 |
| + 4 | 40 |

13. ආසන්න දහයේ ගුණාකාරයට වටයා ලියන්න.

සියලුම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

(i) 36 - (ii) 72 -

14. හිස්තැන් සම්පූර්ණ කරන්න.




15. දින 2, පැයවලින් දක්වන්න.

16. ලබ්ධිය සහ ශේෂය ලියන්න.

$123 \div 6$

ලබ්ධිය - ශේෂය -

17. 15 හි එකතු කිරීම් ඇසුරෙන් හිස්තැන් පුරවන්න.

[8] + [ ]

▶ 15

[ ] + [6]

18. පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාව ආසන්න දහයේ ගුණාකාරයට වැටයූ විට 50 ක් වේ. එම පන්තියේ සිටිය හැකි අඩුම සිසුන් සංඛ්‍යාව කොපමණ ද?

19. 2 , 3, 0 සහ 5 යන ඉලක්කම්වලින්, එක් ඉලක්කමක් එක් වරක් පමණක් යොදා ගනිමින් ලිවිය හැකි ස්ථාන හතරේ විශාලතම සංඛ්‍යාව ලියන්න.

20. මෙම රූපයේ ඇති සමචතුරස්‍ර සංඛ්‍යාව කීය ද?



සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# ගණිතය – II

- **පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද ඉතිරි ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් ද ලැබේ.**

**1.** (a) ඉලක්කමක් ලියූ කාඩ්පත් තුන බැගින් ඇති A හා B නම් වූ පෙට්ටි 2 ක් පහත දැක්වේ.




A පෙට්ටියෙන් එක් කාඩ්පතක් හා B පෙට්ටියෙන් එක් කාඩ්පතක් තෝරාගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) ඔබ තෝරා ගත් නිඛිල දෙක සංඛ්‍යා රේඛාවක් මත සලකුණු කරන්න. (ල. 02)

(ii) < හෝ > අසමානතා ලකුණ යොදා එම නිඛිල දෙක සංසන්දනය කරන්න. (ල. 02)

(iii) A හා B පෙට්ටි දෙකේ ඇති නිඛිල සියල්ලම ආරෝහණ පාටිපාටියට ලියන්න. (ල. 03)

(b) ළමයින් තිදෙනෙකුගේ වයස අවුරුදුවලින් නිරූපණය කළ පහත දැක්වෙන සංඛ්‍යා රේඛාව භාවිතයෙන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) ළමයින් තිදෙනාගේ වයස ලියා දක්වන්න.

කුමාර - නිලාන් - ගයාන් - (ල. 03)

(ii) නිලාන් කුමාරට වඩා අවුරුදු කීයක් වැඩිමල් ද? (ල. 02)

(iii) කුමාර ඉපදී ඇත්තේ 2009 වර්ෂයේ නම් නිලාන් ඉපදී ඇති වර්ෂය කුමක් ද? (ල. 02)

(iv) කණිෂ්කගේ වයස අවුරුදු 8 කි. සංඛ්‍යා රේඛාව ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන ඔහුගේ වයස එහි සලකුණු කරන්න. (ල. 02)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

**2.** (a) 1490230015

(i) ඉහත සංඛ්‍යාව කලාප වලට වෙන් කරන්න. (ල. 03)

(ii) එම සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න. (ල. 02)

(b) ''දෙබිලියන තුන්සිය විසි මිලියන දෙසිය පන්දහස් පහ'' යන සංඛ්‍යාව සම්මත ආකාරයට ලියන්න. (ල. 02)

(c) 3562 යන සංඛ්‍යාවේ,

(i) 3 හි ස්ථානීය අගය කුමක් ද? (ල. 02)

(ii) 6 න් නිරූපණය වන අගය කුමක් ද? (ල. 02)

3 (a) කිසියම් ස්ථානයක උතුරු දිශාව සොයා ගැනිම සඳහා යොදා ගන්නා උපකරණය කුමක් ද? (ල. 01)

(b) ප්‍රධාන දිශා හතර ලියන්න. (ල. 04)




(c)




ඉහත රූපය ඇසුරෙන් හිස්තැන් පුරවන්න.

(i) පාසලට .................................. දිශාවෙන් බස් නැවතුම්පළ පිහිටා ඇත.

(ii) රෝහලට .................................. දිශාවෙන් පාසල පිහිටා ඇත.

(iii) තැපැල් කාර්යාලයට උතුරු දිශාවෙන් .................................. සහ .................................. පිහිටා ඇත. (ල. 04)

(d) ඉහත රූපය ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන පාසලට බටහිර දිශාවෙන් වෙළඳසැල ලකුණු කරන්න. (ල. 02)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

**4.** සුළු කරන්න.

(i) $12 \times 100$ (ල. 01) (ii) $1900 \div 10$ (ල. 02)

(iii) $\begin{array}{r} 43 \\ \times 6 \\ \hline \end{array}$ (ල. 02) (iv) $6 \overline{)3804}$ (ල. 02)

(v) $\begin{array}{r} 63 \\ \times 34 \\ \hline \end{array}$ (ල. 02) (vi) $16 \overline{)512}$ (ල. 02)

**5.** (a) ඔබ කැමති කෝණයක් ඇඳ එහි ශීර්ෂය නම් කරන්න. (ල. 01)

(b) ඔබ අවට ඇති දෑ වලින් සෘජුකෝණ හැඩය දක්නට ලැබෙන අවස්ථා 2 ක් ලියන්න. (ල. 02)

(c) පහත අකුරුවලින් ලකුණු කර ඇති කෝණ කුමන වර්ගයට අයත් දැයි ලියන්න. (ල. 4 x 2=8)




a –

b –

c –

d –

6. (a) එක්තර රූපවාහනී වැඩසටහනක් ප.ව. 3.10 ට ආරම්භ වී ප.ව. 3.50 ට අවසන් විය.

(i) එය ආරම්භ කරන වේලාව හා අවසන් කරන වේලාව සම්මත ආකාරයට ලියන්න.

ප.ව. 3.10 - ප.ව. 3.50 - (ල. 02)

(ii) රූපවාහිනී වැඩසටහන විකාශය වූ කාලය සොයන්න. (ල. 02)

(iii) ඉහත රූපවාහිනි වැඩසටහන විකාශය වූ කාලය අතර මිනිත්තු 10 යි තත්පර 30 ක වෙළඳ දැන්වීමක් විකාශය වූයේ නම්, එම රූපවාහිනී වැඩසටහනට පමණක් ගත වූ කාලය කොපමණ ද? (ල. 03)

(b) තත්පර 320, මිනිත්තු හා තත්පර වලින් දක්වන්න. (ල. 02)

(c) එකතු කරන්න.

දින පැය

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

| | |
|---|---|
| 10 | 10 |
| + 3 | 8 |

(ල. 02)